# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## අවලංගු කළ නොහැකි තෑගි ඔප්පු බලවත් අකෘතඥතාවය පදනම් කොටගෙන අවලංගු කිරීමේ

**අවලංගු කළ නොහැකි තෑගි ඔප්පු බලවත් අකෘතඥතාවය පදනම් කොටගෙන අවලංගු කිරීම සඳහා ද, ඊට සම්බන්ධ හා ආනුෂංගික කරුණු සඳහා ද, විධිවිධාන සැලැස්වීම පිණිස වූ පනත් කෙටුම්පතකි.**

---

අධිකරණ අමාත්‍යතුමා විසින් 2017 පෙබරවාරි මස 21 වන දින ඉදිරිපත් කරන ලදී.

(ගැසට් පත්‍රයේ පළ කළේ 2017 ජනවාරි මස 23 වන දින)

මුද්‍රණය කිරීමට පාර්ලිමේන්තුව විසින් නියෝග කරන ලදී.

---

[164 වන පනත් කෙටුම්පත]

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකිය.

**මිළ : රු. 6.00 යි.** **තැපැල් ගාස්තුව : රු. 10.00 යි.**

2—PL 005044—475 (2017/02)

# අවලංගු කළ නොහැකි තෑගි ඔප්පු බලවත් අකෘතඥතාවය පදනම් කොටගෙන අවලංගු කිරීමේ

එල්.ඩී.— ඕ. 53/2015.

**අවලංගු කළ නොහැකි තෑගි ඔප්පු බලවත් අකෘතඥතාවය පදනම් කොටගෙන අවලංගු කිරීම සඳහා ද, ඊට සම්බන්ධ හා ආනුෂංගික කරුණු සඳහා ද, විධිවිධාන සැලැස්වීම පිණිස වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

ලුහුඬු නාමය.

1. මේ පනත 2017 අංක දරන අවලංගු කළ නොහැකි තෑගි ඔප්පු බලවත් අකෘතඥතාවය පදනම් කොටගෙන අවලංගු කිරීමේ පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

නිසි අධිකරණ බලය ඇති අධිකරණයක් විසින් අවලංගු කළ නොහැකි තෑගි ඔප්පුවක් අවලංගු කිරීම.

2. අවලංගු කළ නොහැකි තෑගි ඔප්පුවක්, බලවත් අකෘතඥතාවය පදනම් කොටගෙන අවලංගු කරවා ගැනීම සඳහා එහි තෑගි ලැබුම්කරුට එරෙහිව එම ඔප්පුවේ තෑගි දීමනාකරු විසින් පවරනු ලබන නඩුවක දී, නිසි අධිකරණ බලය ඇති අධිකරණයක් විසින් කරනු ලබන ආඥාවක් මගින් පමණක් අවලංගු කරනු ලැබිය හැකි ය.

නඩුව ගොනු කළ යුතු කාලසීමාව.

3. තෑගි ඔප්පුව ලියා අත්සන් කිරීමේ දින සිට අවුරුදු දහයක කාලයක් ඇතුළත සහ නඩු නිමිත්ත පැන නැගුණු දිනයේ සිට අවුරුදු දෙකක කාලයක් ඇතුළත එම නඩුව ගොනු කර ඇත්නම් මිස, 2 වන වගන්තියේ සඳහන් නඩුවක්, අධිකරණය විසින් භාරගනු නොලැබිය යුතු ය.

නඩුව ඇසීමට තිබෙන නඩුවක් ලෙස අධිකරණයේ ලියාපදිංචි කිරීම සඳහා පැමිණිලිකරු විසින් ඉල්ලුම් කළ යුතු බව.

4. (1) මේ පනතේ විධිවිධාන යටතේ ගොනු කරන ලද නඩුවක පැමිණිලිකරු විසින්, ඒ නඩුව ඇසීමට තිබෙන (ලිස්පෙන්ඩන්ස්) නඩුවක් ලෙස ලියාපදිංචි කිරීම පිණිස —

(අ) අවලංගු කිරීමට අපේක්ෂිත ඔප්පුව ලියාපදිංචි කර ඇති දිස්ත්‍රික්කයේ ඉඩම් රෙජිස්ට්‍රාර්වරයා වෙත යැවීම සඳහා වූ ඉල්ලුම් පත්‍රයක්; හෝ

(ආ) අවලංගු කිරීමට අපේක්ෂිත ඔප්පුව ලියාපදිංචි කර නොමැති අවස්ථාවක, එම ඔප්පුවට අදාළ ඉඩම පිහිටා ඇති දිස්ත්‍රික්කයේ ඉඩම් රෙජිස්ට්‍රාර්වරයා වෙත යැවීම සඳහා වූ ඉල්ලුම් පත්‍රයක්,

පැමිණිල්ල සමග ගොනු කිරීමට සැලැස්වීම හෝ ගොනු කිරීම කළ යුතු ය.

PL 004957 -475 (2016/12)

(2) ඉහත (1) වන උපවගන්තියේ සඳහන් ඉල්ලුම් පත්‍රය පිටපත් තුනකින් යුක්ත විය යුතු අතර, එහි “මුල් පිටපත”, “1 වන පිටපත” සහ “2 වන පිටපත” යනුවෙන් සලකුණු කර (117 වන අධිකාරය වූ) ලේඛන ලියාපදිංචි කිරීමේ ආඥා පනතේ දක්වා ඇති ආකෘතියට සාරානුකූලව සකස් කළ යුතු ය. අධිකරණය විසින් ඒ නඩුවට දෙනු ලබන අංකය ඇතුළත් කිරීම සඳහා හිස් ස්ථානයක් එහි තිබිය යුතු ය.

සිවිල් නඩු විධාන සංග්‍රහයේ අදාළත්වය.

**5.** මේ පනතේ විධිවිධාන යටතේ ගොනු කරනු ලබන සෑම නඩුවක් ම, සිවිල් නඩු විධාන සංග්‍රහයේ (101 වන අධිකාරය) විධිවිධාන සලසා ඇති කාර්ය පටිපාටියට අනුකූලව පවත්වාගෙන යා යුතු අතර, එම කාර්ය පටිපාටිය මගින් නියාමනය විය යුතු ය.

අර්ථ නිරූපණය.

**6.** පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස —

“ඉඩම් රෙජිස්ට්‍රාර්වරයා” යන්නෙන්, (117 වන අධිකාරය වූ) ලේඛන ලියාපදිංචි කිරීමේ ආඥාපනත යටතේ පත් කරනු ලැබුවා වූ ද අවලංගු කරන ලෙස ඉල්ලා සිටිනු ලබන අවලංගු කළ නොහැකි තෑගි ඔප්පුවක විෂය ගත ඉඩම පිහිටා ඇති දිස්ත්‍රික් බල සීමාව අයත් වූ ද ඉඩම් රෙජිස්ට්‍රාර්වරයා අදහස් වේ; සහ

“ඉඩම” යන්නට, (117 වන අධිකාරය වූ) ලේඛන ලියාපදිංචි කිරීමේ ආඥා පනතේ ඇති අර්ථය ම තිබිය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

**7.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 163, කිරුළපන මාවත, පොල්හේන්ගොඩ, කොළඹ 05, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ, ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.